# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

**අංක 2261/33 – 2022 ජනවාරි මස 05 වැනි බදාදා – 2022.01.05**

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# I වැනි කොටස: (I) වැනි ඡෙදය – සාමාන්‍ය

## රජයේ නිවේදන

**1974 අංක 02 දරන ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩල පනත**

92 වැනි වගන්තිය යටතේ නියමය

1974 අංක 02 දරන ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩල පනතේ, 92 වැනි වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර, ජල සම්පාදන අමාත්‍ය, වාසුදේව නානායක්කාර වන මම, එකී මණ්ඩලයට නාවලපිටිය පල්ලේගම ජල සම්පාදන ව්‍යාපෘතියේ ගලබඩ ඇල්ල ජල සම්පාදන උප ව්‍යාපෘතියේ, මාපාකන්ද ජල ගබඩා ටැංකිය ඉදි කිරීම සඳහා ඉඩම් කොටසක් අවශ්‍ය වී ඇති හෙයින්, මෙහි පහත උපලේඛනයෙහි දැක්වෙන ඉඩම් කොටසේ නිශ්චල දේපළ අයිතිය අත්කර ගැනීම මෙම නියමයෙන් අනුමත කරමි.

වාසුදේව නානායක්කාර,<br>ජල සම්පාදන අමාත්‍ය.

යොමු අංකය: DVP/02/01/KY/351.<br>
2021 දෙසැම්බර් මස 31 වැනි දින,<br>
ජල සම්පාදන අමාත්‍යාංශය,<br>
අංක 35, ''ලක්දිය මැදුර'',<br>
නව පාර්ලිමේන්තු පාර,<br>
පැලවත්ත,<br>
බත්තරමුල්ල.


1A – G 35749 – 43 (2022/01)

*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

**උපලේඛනය**

මධ්‍යම පළාතේ, මහනුවර දිස්ත්‍රික්කයේ, පස්බාගේ කෝරළේ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, අංක 1101, මාපාකන්ද දකුණ ග්‍රාම නිලධාරි කොට්ඨාසයේ, මාපාකන්ද දෙකිඳගම ගමේ පිහිටි, පහත සඳහන් මායිම් තුළ පිහිටි පර්චස් 25ක් පමණ වන ඉඩම් කොටස:

*මායිම්:*

*උතුරට* : විමලරත්න හිමිකම් කියන ඉඩම;
*නැගෙනහිරට* : මෙම ඉඩමේ ඉතිරි කොටස;
*දකුණට* : මෙම ඉඩමේ ඉතිරි කොටස;
*බටහිරට* : නිවසට ඇති බොරළු පාර.

*ඉඩමට හිමිකම් කියන අයගේ නම සහ ලිපිනය* :

1. එස්. පී. ජී. ඇසිලින් මහත්මිය,
අංක 60,
මාපාකන්ද දකුණ,
නාවලපිටිය.

EOG 01 – 0042

---

**1974 අංක 02 දරන ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩල පනත**

92 වැනි වගන්තිය යටතේ නියමය

1974 අංක 02 දරන ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩල පනතේ, 92 වැනි වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර, ජල සම්පාදන අමාත්‍ය, වාසුදේව නානායක්කාර වන මම, එකී මණ්ඩලයට ගඟ ඉහළ කෝරළේ ජල සම්පාදන ව්‍යාපෘතියෙහි පිටකන්ද ජල ගබඩා ටැංකිය ඉදිකිරීම සඳහා ඉඩම් කොටසක් අත්කර ගැනීමට අවශ්‍යව ඇති හෙයින්, මෙහි පහත උපලේඛනයෙහි දැක්වෙන ඉඩම් කොටසේ නිශ්චල දේපළ අයිතිය අත්කර ගැනීම මෙම නියමයෙන් අනුමත කරමි.

**වාසුදේව නානායක්කාර,**
ජල සම්පාදන අමාත්‍ය.

යොමු අංකය: DVP/02/01/KY/294.
2021 දෙසැම්බර් මස 27 වැනි දින,
ජල සම්පාදන අමාත්‍යාංශය,
අංක 35, ''ලක්දිය මැදුර'',
නව පාර්ලිමේන්තු පාර,
පැලවත්ත,
බත්තරමුල්ල.

**උපලේඛනය**

මධ්‍යම පළාතේ, මහනුවර දිස්ත්‍රික්කයේ, ගඟ ඉහළ කෝරළේ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, අංක 1054, පිටකන්ද ග්‍රාම නිලධාරි කොට්ඨාසයේ, හල්දොල ගමේ පිහිටි ''සමර්සෙට් වත්ත'' නමැති ඉඩමෙන් පහත සඳහන් මායිම් තුළ පිහිටි පර්චස් 20ක් පමණ වන ඉඩම් කොටස:

*මායිම්:*

*උතුරට* : ඩී. ජී. රත්නපාල හිමිකම් කියන ඉඩම;
*නැගෙනහිරට* : මෙම ඉඩමේ ඉතිරි කොටස;
*දකුණට* : මෙම ඉඩමේ ඉතිරි කොටස;
*බටහිරට* : එස්. ජී. මේරි නෝනා හිමිකම් කියන ඉඩම.

*ඉඩමට හිමිකම් කියන අයගේ නම සහ ලිපිනය* :

1. ආර්. ඒ. නිහාල් රත්නායක මහතා,
හල්දොල,
උඩහේන්තැන්න.

EOG 01 – 0043

**1974 අංක 02 දරන ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩල පනත**

92 වැනි වගන්තිය යටතේ නියමය

1974 අංක 02 දරන ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩල පනතේ, 92 වැනි වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර, ජල සම්පාදන අමාත්‍ය, වාසුදේව නානායක්කාර වන මම, එකී මණ්ඩලයට කුණ්ඩසාලේ - හාරගම ජල සම්පාදන ව්‍යාපෘතියෙහි, නෙල්ලිගල සේවා ජලාශය (වැරැල්ලගස්වැව) ඉදිකිරීම සඳහා ඉඩම් කොටසක් අත්කර ගැනීමට අවශ්‍ය වී ඇති හෙයින්, මෙහි පහත උපලේඛනයෙහි දැක්වෙන ඉඩම් කොටසේ නිශ්චල දේපළ අයිතිය අත්කර ගැනීම මෙම නියමයෙන් අනුමත කරමි.

**වාසුදේව නානායක්කාර,**
ජල සම්පාදන අමාත්‍ය.

යොමු අංකය: DVP/02/01/KY/338.
2021 දෙසැම්බර් මස 27 වැනි දින,
ජල සම්පාදන අමාත්‍යාංශය,
අංක 35, ''ලක්දිය මැදුර'',
නව පාර්ලිමේන්තු පාර,
පැලවත්ත,
බත්තරමුල්ල.

**උපලේඛනය**

මධ්‍යම පළාතේ, මහනුවර දිස්ත්‍රික්කයේ, කුණ්ඩසාලේ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, අංක 652, දෙගල්දොරුව ග්‍රාම නිලධාරි කොට්ඨාසයේ දෙගල්දොරුව ගමේ පිහිටි, ''වැරැල්ලගස් වැව'' නමැති ඉඩමෙන් පහත සඳහන් මායිම් තුළ පිහිටි පර්චස් 20ක් පමණ වන ඉඩම් කොටස:

මායිම්:

*උතුරට* : මයුරි ලලිතා ගුණසිංහ හිමිකම් කියන මෙම ඉඩමේ ඉතිරි කොටස;
*නැගෙනහිරට* : ආර්. පී. ජී. පී. රණසිංහ මහතා හිමිකම් කියන ඉඩම;
*දකුණට* : හිජ්ජස්පිටිය සිට බෝධිගල පන්සල දක්වා දිවෙන මාර්ගය;
*බටහිරට* : මයුරි ලලිතා ගුණසිංහ හිමිකම් කියන මෙම ඉඩමේ ඉතිරි කොටස.

*ඉඩමට හිමිකම් කියන අයගේ නම සහ ලිපිනය* :

1. මයුරි ලලිතා ගුණසිංහ මහත්මිය,
අංක 100,
ලේවැල්ල පාර,
මහනුවර.

EOG 01 – 0044